ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

පරිසර චක්‍රලේඛ - PS/FEA/Circular/4/2025

2025 මැයි මස 14 වන දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2025 ජූනි 05**

පාරිසරික ගැටළු පිලිබඳව ලෝකවාසී ජනතාවගේ අවධානය යොමු කිරීමේ අදිටනින් 1972 වර්ෂයේ දී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර දී පැවැති මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සෑම වසරකම ජූනි මස 05 වන දින ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. එතැන් සිට දශක පහකට වැඩි කාලයක් ලෝකවාසී ජනතාවගේ ගෝලීය පාරිසරික ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට සහ පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගැනීමට ලෝක නායකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරලීම පිණිස එක් එක් වර්ෂයන් හි දී විශේෂිත තේමා යටතේ මෙම සුවිශේෂී දිනය සමරනු ලැබේ.

02. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් 2025 ලෝක පරිසර දිනය “Ending Plastic Pollution” යන ගෝලීය තේමාව යටතේ සැමරීම සඳහා කටයුතු සංවිධානය කර ඇත. මෙමගින් ගෝලීය වශයෙන් ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණයට අවසන් විසඳුමක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ප්ලාස්ටික් දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා සාමූහික ක්‍රියාමාර්ගයක් අපේක්ෂා කරයි.

03. සීඝ්‍රයෙන් ඉහළ යන ප්ලාස්ටික් භාවිතය තිරසාර සංවර්ධනයේ පාරිසරික, සමාජීය, ආර්ථික සහ සෞඛ්‍ය මානයන් කෙරෙහි අහිතකර ලෙස බලපාන බරපතල ගෝලීය පාරිසරික ගැටලුවක් බවට පත්ව ඇත. මිනිස් පරිභෝජන රටාව තුළ ප්ලාස්ටික් භාවිතය අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වී ඇත. පසුගිය දශක කිහිපය තුළ ප්ලාස්ටික් නිෂ්පාදනය සීඝ්‍රලෙස ඉහළ ගොස් ඇති අතර ගෝලීය වශයෙන් දැනට එය වසරකට ටොන් මිලියන 430 ක් පමණ වේ. වසර 2040 වන විට මෙම අගය දෙගුණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එයින් 2/3 ක පමණ ප්‍රමාණයක් එක් වරක් පමණක් භාවිත කර ඉවත දමන නිෂ්පාදන වේ. මෙසේ ඉවත් කරන ප්ලාස්ටික්වලින් 10% ටත් අඩු ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමුවන අතර 12 % ක පමණ ප්‍රමාණයක් විවිධ හේතූන් මත ගිනි තැබීමට ලක්වේ. ඉතිරිය ගොඩකිරීම්වලට බැහැර කිරීම හා සාගර ඇතුළු ජල මාර්ගවලට මුදා හැරීම සිදු කරයි. සියලුම සාගර දූෂණයෙන් 80% ක් ප්ලාස්ටික් අපද්‍රව්‍ය වන අතර සෑම වසරකම ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් මිලියන 8-10ක ප්‍රමාණයක් සාගරයට එකතු වේ. වර්තමානයේ සාගරයේ ප්ලාස්ටික් හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් කැබලි ට්‍රිලියන 50-75ක් පමණ ඇති අතර මේවා ආහාර, ජලය සහ වාතය හරහා ජීවීන්ගේ සිරුරට ඇතුලු වී

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන
தொலைபேசி
Telephones ++ 94 (0) 11 2354418
++ 94 (0) 11 2473873
ෆැක්ස්
தொலைநகல்
Fax ++ 94 11 2446657
ඊ-තැපැල
மின்-அஞ்சல்
e-mail prsec@presidentsoffice.lk

සෞඛ්‍ය ගැටලු රැසක් ඇති කරයි. පෘථිවියේ සෑම පුද්ගලයෙකුම වසරකට ප්ලාස්ටික් අංශු 50,000 කට වඩා පරිභෝජනය කරන බවට ඇස්තමේන්තු කර ඇත.

04. වර්තමාන රජයේ ප්‍රමුඛ වැඩසටහනක් වන Clean Sri Lanka වැඩසටහනේ පරිසරය කුළුණ යටතේ පරිසරයට ආදරය කරන සමාජයක් බිහිකිරීම ප්‍රධාන අපේක්ෂාව වේ. ඒ සඳහා පරිසරය සුරකින හා එහි තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා වන විවිධ ක්‍රියාකාරකම් සඳහා ජනතාව බද්ධ කරගැනීම සිදුකරමින් සිටියි. එහි එක් පියවරක් ලෙස ලෝක පරිසර දිනයේ තේමාව හා එක්වෙමින් පරිසරය හා මානව සෞඛ්‍යය දැඩි ලෙස තර්ජනයට ලක්කර ඇති ප්ලාස්ටික් භාවිතය හා අනිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කර ඇත. එමගින් දැනට මුහුණ දෙන පාරිසරික අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා පුද්ගලයින්ගේ ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් නැවත සිතීම (Rethink), ප්‍රතික්ෂේප කිරීම (Refuse), අඩු කිරීම (Reduce), නැවත භාවිතා කිරීම (Reuse) සහ ප්‍රතිචක්‍රීකරණය (Recycle) යන සංකල්ප හඳුන්වා දෙමින් තිරසාර ජීවන රටාවකට හුරු කෙරේ. මෙම ආකල්ප තුලින් ප්ලාස්ටික් හා පොලිතීන් නිෂ්පාදකයාගේ සිට ඒවා පරිහරණය කරන අවසාන පරිභෝගිකයා දක්වා පරිසර හිතකාමී නිෂ්පාදන දිරිගැන්වීම, අවභාවිතය අඩු කිරීම, නිවැරදිව බැහැර කිරීම, ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම, විකල්ප භාවිතයට දිරි ගැන්වීම හා දැනුවත් කිරීමෙන් සියළු පුරවැසියන් පරිසරය සුරැකීම සඳහා පෙළඹවීමට ජගත් පරිසර දිනය සුවිශේෂී අවස්ථාවක් ලෙස සලකා සැමරීම සිදුකළ යුතු අතර එම ක්‍රියාවන්ගේ තිරසාර පැවැත්ම කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කල යුතුය.

05. මේ සියළු කාරණා සැලකිල්ලට ගනිමින් "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව 2016 අප්‍රේල් 28 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව "ජාතික පරිසර සතියක්" ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව මැයි 30 සිට ජූනි 05 දක්වා සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම දිනයන් පහත පරිදි නම් කර ඇත.

| | |
|---|---|
| මැයි 30 | ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය |
| මැයි 31 | වායු දූෂණය හා එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය |
| ජූනි 01 | පරිසර පවිත්‍රතාවය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය |
| ජූනි 02 | ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය |
| ජූනි 03 | ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය |
| ජූනි 04 | වෙරළ කලාප පවිත්‍ර කිරීමේ දිනය |
| ජූනි 05 | රුක්රෝපණය හා ජගත් පරිසර දින සැමරුම |

06. ඒ අනුව, ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍ර, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

I. සියලුම පාසල් හා ආයතනවල ප්ලාස්ටික් භාවිතා කිරීමෙන් සිදුවන හානි පිලිබඳව හා ප්ලාස්ටික් වෙනුවට යොදා ගත හැකි විකල්ප පිලිබද දැනුවත් කිරීම හා ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් ප්ලාස්ටික් භාවිතය පිලිබද නැවත සිතීම (Rethink), ප්‍රතික්ෂේප කිරීම (Refuse), අඩු කිරීම (Reduce), නැවත භාවිතා කිරීම (Reuse) සහ ප්‍රතිචක්‍රීකරණය (Recycle) යන සංකල්ප හඳුන්වා දෙමින් තිරසාර ජීවන රටාවකට හුරු කිරීම පිලිබද දැනුවත් කිරීමේ වැඩසටහන්

II. සියලුම පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් ප්ලාස්ටික් ක්‍රමවත්ව බැහැර කිරීම සඳහා පරිසරය පවිත්‍ර කිරීම, ඉවත දමන ලද ප්ලාස්ටික්/පොලිතීන් එකතු කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

III. සියලුම පළාත් පාලන ආයතන විසින් ප්ලාස්ටික් පිළිස්සීම, ගොඩකිරීම්වලට බැහැර කිරීම හා සාගර ඇතුළු ජල මාර්ගවලට මුදා හැරීම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

IV. නිවසේදී, කාර්යාලයේදී සහ පාසලේදී ඉවත දමන ලද ප්ලාස්ටික් එකතු කර ඒවා කසල එකතු කිරීමේ මධ්‍යස්ථානවලට යොමු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

V. දිවයින පුරා පළාත් පාලන ආයතන යටතේ පාලනය වන උද්‍යාන, ක්‍රීඩා පිටි, වෙරළ උද්‍යාන හා ප්‍රජාශාලා වැනි පොදු ස්ථානවල ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

VI. පරිසර හිතකාමී ප්ලාස්ටික් නිෂ්පාදනය හා ආනයනය සඳහා පවතින නෛතික රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම හා ඒ පිළිබඳව මහජනතාව ඇතුලු අදාල පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම

VII. පොදු ස්ථානවල පරිසරය අලංකාර කිරීමේ වැඩසටහන්

VIII. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IX. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වැඩසටහන් සංවිධානය කිරීම

X. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

XI. වෙරළ ආශ්‍රිත පරිසර කළාප තුළ ප්ලාස්ටික්/පොලිතීන් භාවිතය අවම කිරීම

XII. වෙරළ තීරයේ තුරු ආවරණය වැඩි කිරීමට හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම

XIII. ප්ලාස්ටික්/ පොලිතීන් සඳහා විකල්ප හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

07. සෑම ආයතනයක් විසින්ම ඉහත යෝජිත පරිදි සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ ද සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වමි. එසේම මෙම වැඩසටහන්වල තිරසාරභාවය පවත්වාගෙන යාම සඳහා සියලු පාසල්/ආයතන මට්ටමින් සුදුසු වැඩසටහන් මාසිකව/කාර්තුමය වශයෙන් ක්‍රියාත්මක කල යුතුය.

08. මෙම වැඩසටහන්වල ප්‍රගතිය පරිසර අමාත්‍යාංශ ලේකම් වෙත මෘදු පිටපතක් මගින් pedudivision@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

09. මෙම කාර්යයන් සිදු කිරීමේදී රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකළ යුතු බවද දන්වමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබගේ සක්‍රිය දායකත්වය හා සහයෝගය අපේක්ෂා කරමි.

ආචාර්ය නන්දික සනත් කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත්: 01. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.ස.